# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2362/79 – 2023 දෙසැම්බර් මස 15 වැනි සිකුරාදා – 2023.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 මැයි මස 28 වැනි දින අංක 1812/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 165 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/UDA/368.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: ප්‍රාලේ/ඉම/ඉ3/2/A.
2023 නොවැම්බර් මස 15 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 172, ඉමදූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉමදූව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/IMD/2023/235 හා 2023.09.01 දිනැති අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'D' – ගොඩකුඹුර, කබලවිල සහ කබලවිලකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0144

උතුරට: මුපි ගා 4089 හි කැබලි අංක 49, ආර්. එච්. සිරියාංගනී, එස්. කේ. පතිරණ සහ සිඩ්නි ජයසේකර හිමිකම් කියන කබලවිල; නැගෙනහිරට: ආර්. එච්. සිරියාංගනී, එස්. කේ. පතිරණ සහ සිඩ්නි ජයසේකර සහ ඒ. එස්. කේ. පරණවිතාන හිමිකම් කියන කබලවිල; දකුණට: ඒ. එස්. කේ. පරණවිතාන, එම්. වී. තිලකසිරි සමරවීර සහ එම්. වී. වසන්තා පද්මිණී සමරවීර හිමිකම් කියන කබලවිල; බටහිරට: එම්. වී. තිලකසිරි සමරවීර, එම්. වී. වසන්තා පද්මිණී සමරවීර සහ ආර්. ජී. ජිනදාස හිමිකම් කියන කබලවිල.

EOG 12 – 0257

1A – G 041034 – 19 (2023/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 ඔක්තෝබර් මස 04 වැනි දින අංක 1830/51 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 300 දරන ආඥාවේ සහ එම ආඥාවට සංශෝධනයක් කරමින් 2014 ජුනි 25 වැනි දින අංක 1868/51 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2013 අංක 300 දරන ආඥාවේ ශුද්ධි පත්‍රිකාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/234.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/MH/07.
2023 නොවැම්බර් මස 15 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**1 උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 256D, ජම්බුගස්මුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගංගොඩවිල (මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2023/448 හා 2023.10.16 දිනැති අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – ගුණවර්ධන උයන්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0279**

උතුරට: මූ.පි.කො. 9628 හි කැබලි අංක 10 සහ 7; නැගෙනහිරට: මූ.පි.කො. 9628 හි කැබලි අංක 7 සහ 10; දකුණට: මූ.පි.කො. 9628 හි කැබලි අංක 10; බටහිරට: මූ.පි.කො. 9628 හි කැබලි අංක 10 (මාර්ගය).

EOG 12 – 0256